# ග්‍රාම නිලධාරී නව පත්වීම් ප්‍රදානෝත්සවය - 2024

2023.12.02 දින පැවති ග්‍රාම නිලධාරී III වන ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වූ ලිඛිත තරග විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ත්‍රෛමාසික පුහුණුව සඳහා කැඳවීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මෙම වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවේ සමාරම්භක උත්සවය ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.05.08 දින කොළඹ 03, කොල්ලුපිටිය, ගාලු පාරේ පිහිටි අරලියගහ මන්දිරයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

03. මෙම උත්සවය සඳහා එදින පෙ.ව. 7.30 වන විට පැමිණිය යුතු අතර මේ සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ පැමිණීම අනිවාර්ය වේ. සියළුම අයදුම්කරුවන් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත හා කැඳවීම් ලිපිය රැගෙන ආ යුතුය. මෙම අවස්ථාවට අයදුම්කරු සමඟ වෙනත් කිසිඳු අයෙකුට සහභාගී වීමට අවස්ථාව හිමි නොවන බව අවධාරණය කරමි.

04. රැස්වීම් ශාලාවට ඇතුළුවීමේදී හා අසුන් ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙස ද කාරුණිකව දන්වමි.

- ❖ රැස්වීම් ශාලාවට ඇතුල් වීමේදී ප්‍රධාන දොරටුව අසළ පිහිටුවා ඇති අදාල ලියාපදිංචි කිරීමේ කවුළුවේදී ලියාපදිංචි විය යුතුය.
- ❖ රැස්වීම් ශාලාවට ඇතුල් වීමේදී අරලියගහ මන්දිරයේ බේරේ වැව දොරටුවෙන් ඇතුල් විය යුතු අතර අසුන් ගැනීමේදී ඔබට හිමි ආසන අංකයට අනුව පෙ.ව. 9.30ට ප්‍රථම අසුන්ගත යුතුය.
- ❖ රැස්වීම් ශාලාව තුළට ගමන් මළු, පාර්සල්, ජංගම දුරකතන, කැමරා හා වෙනත් විද්‍යුත් උපකරණ රැගෙන යාමට ඉඩ දෙනු නොලැබේ.
- ❖ එදින පහත සඳහන් ඇඳුමින් සැරසී පැමිණිය යුතු වේ.
    - පිරිමි - ජාතික ඇඳුම/ සුදු හෝ ලා පැහැති අත් දිග කමිසය හා කලු කලිසම
    - කාන්තා - සුදු හෝ ලා පැහැති සාරිය/ඔසරිය
- ❖ ලියාපදිංචි කිරීමේ කවුළුවේදී ලබා දෙනු ලබන ආසන අංකය පැළඳ සිටිය යුතුය.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය